# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2011.03.17
## සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකි වනු පිණිස නිවාඩු දීම

සේවා නියුක්තියකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකි වනු පිණිස නිවාඩු දීම සම්බන්ධයෙන් අදාළ වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 84 අ වන වගන්තියේ විධිවිධාන සේවා යෝජකයන්ගේ හා සේවා නියුක්තිකයන්ගේ දැන ගැනීම පිණිස මෙහි පහත දක්වනු ලැබේ.

"84අ. **(1)** මේ ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට හිමිකම ඇති අන් කිසි තැනැත්තකුගේ සේවායෝජකයකු වූ යම් තැනැත්තකු විසින්, ඒ අන් තැනැත්තා ඡන්දය දීම පිණිස ලියවිල්ලකින් ඉල්ලීමක් කළ විට, ඒ ඡන්ද විමසීමේ දී ඒ අන් තැනැත්තාට ඡන්දය දීම පිණිස සේවායෝජකයා විසින් ප්‍රමාණවත් යයි සලකනු ලබන (පැය දෙකකට නො අඩු කාලයක) අඛණ්ඩ කාල සීමාවක් සඳහා ඒ අන් තැනැත්තාට පඩි රහිත නො වන නිවාඩු දිය යුතුය.

**(2)(1)** වන උපවගන්තියෙහි විධිවිධාන කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේදී රුපියල් පන්සියයක් නො ඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නො ඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය"

02. ඉහත සඳහන් වගන්තියේ විධිවිධාන ප්‍රකාර ස්වකීය ඡන්දය දීමේ කාර්යය සඳහා නිවාඩු දෙන ලෙස ලියවිල්ලකින් ඉල්ලා සිටින සෑම සේවා නියුක්තිකයෙකුටම නිවාඩු ලබා දිය යුතුය. එසේ දෙනු ලබන නිවාඩු කාල සීමාව, අනියම් සේවා නියුක්තිකයන් ද ඇතුළුව සියලුම සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් වැටුප් සහිත වන විශේෂ නිවාඩුවක් ලෙස සැලකිය යුතු අතර, එය සේවා නියුක්තිකයන්ගේ සාමාන්‍ය නිවාඩු හිමිකමෙන් පිටස්තර විය යුතුය.

03. සේවා නියුක්තිකයෙකුට මෙම කාර්යය සඳහා දෙනු ලබන නිවාඩු කාලසීමාව, එම සේවා නියුක්තිකයාගේ කාර්ය ස්ථානය සහ ඡන්ද පොළ අතර ඇති දුර ප්‍රමාණය මත, සේවා යෝජකයා විසින් නිගමනය කළ යුතුය. නීතිය අනුව නිවාඩු ලබා ගැනීම පිළිබඳව මෙයට පෙර පැවති ඡන්ද විමසීම් වලදී සේවා නියුක්තිකයන්ගෙන් පැමිණිලි ලැබී ඇති හෙයින් මෙම ඡන්ද විමසීමේදී ඡන්දය දීමට හිමිකම ඇති ස්වකීය සේවා නියුක්තිකයන්ට, නීත්‍යානුකූලව හිමි වන එම නිවාඩුව ලබා දෙන ලෙස රාජ්‍ය හා පෞද්ගලික යන දෙපාර්ශවයේ සියළුම සේවා යෝජකයන්ගෙන් මම ඉල්ලා සිටිමි.

04. ඉහත සඳහන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2011.03.17 වන දින පෙරවරු 7.00 සිට පස්වරු 4.00 දක්වා පැවැත් වේ.

05. මේ සම්බන්ධයෙන් සියළුම සේවා යෝජකයින්ගෙන් ලැබෙන සහයෝගය අතිශයින් අගය කොට සලකමි.

දයානන්ද දිසානායක,
මැතිවරණ කොමසාරිස්.

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.
2011.03.03

LAEB/COM4/Ga_03-3-1-1